සියලු ම හිමිකම් ඇවිරිණි /All Rights Reserved ]

Ravindu Bandaranayake - ictfromabc

## Information and Communication Technology
## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

# 2026 QUIZ NO 552

2026/06/15
ictfromabc
Ravindu Bandaranayake

1. What is the hexadecimal number equivalent to the two's complement of -8?
   -8 හි දෙකෙහි අනුපූරකයට තුල්‍ය ෂඩ් දශමය සංඛ්‍යාව කුමක්ද?

   1) $F8_{16}$ 2) $8_{16}$ 3) $F7_{16}$ 4) $A6_{16}$ 5) $E5_{16}$

2. What is the correct POS expression that represents the Kmap?
   කානෝ සිතියම නිරූපණය කරන නිවැරදි POS ප්‍රකාශනය වනුයේ කුමක්ද?

| CD \ AB | 00 | 01 | 11 | 10 |
|---|---|---|---|---|
| 00 | 0 | | | 0 |
| 01 | | 0 | 0 | |
| 11 | | 0 | 0 | |
| 10 | 0 | | | 0 |

   1) $(\bar{A} + \bar{C}).(A + C)$
   2) $(\bar{A}.\bar{C}) + (A.C)$
   3) $(\bar{B} + \bar{D}).(B + D)$
   4) $(\bar{A} + \bar{C})$
   5) $(A + \bar{D}).(B + C)$

3. What can be a potential disadvantage of frequent swapping?
   නිරන්තරයෙන් ප්‍රතිහරණය කිරීමේ අවාසිය කුමක් විය හැකිද?

   1) Faster process execution. / ක්‍රියාවලි වේගවත්ව ක්‍රියාත්මක කිරීම.
   2) Increased system security. / පද්ධතියේ ආරක්ෂාව වැඩි කිරීම.
   3) Decreased system performance due to higher disk I/O.
      ඉහළ ආදාන ප්‍රතිදාන ක්‍රියාකාරකම් නිසා පද්ධතියේ ක්‍රියාකාරීත්වය අඩු වීම.
   4) Lower memory utilization. / අඩු මතක භාවිතය.
   5) Reduced number of running processes. / ධාවනය වන ක්‍රියාවලි ගණන අඩු වීම.

4. Which SQL statement is used to remove the Phone column from the Customer table?
   Customer වගුවෙන් Phone තීරුව ඉවත් කිරීමට භාවිතා කරන SQL ප්‍රකාශය කුමක්ද?

   1) `DELETE COLUMN Phone FROM Customer;`
   2) `REMOVE Phone FROM Customer;`
   3) `ALTER TABLE Customer DELETE Phone;`
   4) `DROP Phone COLUMN FROM Customer;`
   5) `ALTER TABLE Customer DROP COLUMN Phone;`

5. Which of the following statements about Python variable scope is correct?
   පයිතන් විචල්‍ය විෂය පථය පිළිබඳ පහත සඳහන් කුමන ප්‍රකාශය නිවැරදිද?

   1) Variables defined inside a function are accessible globally.
      ශ්‍රිතයක් තුළ අර්ථ දක්වා ඇති විචල්‍ය ගෝලීය වශයෙන් ප්‍රවේශ විය හැකිය.
   2) Variables declared as global within a function retain their values outside the function.
      ශ්‍රිතයක් තුළ ගෝලීය වශයෙන් ප්‍රකාශ කරන ලද විචල්‍යයන් ශ්‍රිතයෙන් පිටත සිය අගයන් රඳවා ගනී.
   3) Variables defined in the global scope are automatically protected from being modified in functions.
      ගෝලීය විෂය පථය තුළ අර්ථ දක්වා ඇති විචල්‍යයන් ශ්‍රිතවල වෙනස් කිරීමෙන් ස්වයංක්‍රියව ආරක්ෂා වේ.
   4) The `nonlocal` keyword allows modifying variables only in the global scope.
      `nonlocal` මුල පදය ගෝලීය විෂය පථය තුළ පමණක් විචල්‍යයන් වෙනස් කිරීමට ඉඩ දෙයි.
   5) Variables defined with the `local` keyword are unique to Python.
      `local` මුල පදය සමඟ අර්ථ දක්වා ඇති විචල්‍යයන් පයිතන් සඳහා අනන්‍ය වේ.

6. A proposed hospital management system was found to be difficult for the hospital staff to adapt to, and it would disrupt their daily workflows.
යෝජිත රෝහල් කළමනාකරණ පද්ධතියක් රෝහල් කාර්ය මණ්ඩලයට අනුවර්තනය වීමට අපහසු බව සොයා ගන්නා ලද අතර එය ඔවුන්ගේ දෛනික කාර්ය ප්‍රවාහයට බාධාවක් වනු ඇත.

   Which feasibility is most relevant here / මෙහි වඩාත්ම අදාළ වන්නේ කුමන ශක්‍යතාවද?

   1) Economic feasibility / ආර්ථික ශක්‍යතාව
   2) Operational feasibility / මෙහෙයුම් ශක්‍යතාව
   3) Technical feasibility / තාක්ෂණික ශක්‍යතාව
   4) Schedule feasibility / නියමාවලි ශක්‍යතාව
   5) Legal feasibility / නෛතික ශක්‍යතාව

7. In PHP, what is called a multi-dimensional array?
PHP හි multi-dimensional array එකක් ලෙස හඳුන්වන්නේ කුමක්ද?

   1) Arrays that use named keys instead of indices.
   දර්ශක වෙනුවට නම් කරන ලද යතුරු භාවිතා කරන අරා වේ.
   2) These are the arrays that have numeric indices / මේවා සංඛ්‍යාත්මක දර්ශක ඇති අරා වේ.
   3) These arrays can only store a fixed number of elements.
   මෙම අරා වලට ගබඩා කළ හැක්කේ ස්ථාවර මූලාංග සංඛ්‍යාවක් පමණි.
   4) These arrays can store only elements of the same data type.
   මෙම අරා වලට ගබඩා කළ හැක්කේ එකම දත්ත වර්ගයේ මූලාංග. පමණි.
   5) These are the arrays which are containing one or more arrays.
   මේවා අරා එකක් හෝ කිහිපයක් අඩංගු අරා වේ.

8. Which can be considered as true statement/s related to the following HTML code?
පහත දැක්වෙන HTML කේතයට අදාළ සත්‍ය ප්‍රකාශ/ය ලෙස සැලකිය හැක්කේ මොනවා ද?

```
<html>
      <head>
            <style>
                  * { color: blue; }
            </style>
      </head>
      <body>
            <h1>Mango</h1>
            <p>Orange</p>
            <p id="para1">Apple</p>
      </body>
</html>
```

   A. The concept of CSS “class” is used.
   CSS “class” යන සංකල්පය භාවිතා වේ.
   B. The style shown in the code affects all elements because it is a universal selector.
   කේතයේ පෙන්වා ඇති විලාසය universal selector එකක් වන නිසා සියලු මූලාංග වලට බලපායි.
   C. The style shown here does not apply to any element of this HTML code.
   මෙහි පෙන්වා ඇති විලාසය මෙම HTML කේතයේ කිසිදු අංගයකට අදාළ නොවේ.

   1) A only A පමණි
   2) C only C පමණි
   3) B only B පමණි
   4) A and B only A සහ B පමණි
   5) A, B and C all A, B සහ C සියල්ල

9. A student's name has 3 parts namely First Name, Middle Name and Last Name. What type of attribute does this belong to?
සිසුවෙකුගේ නම First Name, Middle Name සහ Last Name වශයෙන් කොටස් 3කින් යුක්ත වේ. මෙය අයත් වන උපලක්ෂණ වර්ගය කුමක්ද?

   1) Derived Attributes / ව්‍යුත්පන්න උපලක්ෂණ
   2) Single Valued Attributes / තනි අගයක් සහිත උපලක්ෂණ
   3) Multi Valued Attributes / බහු වටිනාකම් සහිත උපලක්ෂණ
   4) Composite Attributes / සංයුක්ත උපලක්ෂණ
   5) Stored Attributes / ගබඩා උපලක්ෂණ

10. What is the name given to the transmission of data between any 2 devices through another device?
කිසියම් උපාංග 2ක් අතරමැද පවතින තවත් උපාංගයක් හරහා දත්ත සම්ප්‍රේෂණය සිදුකිරීම හඳුන්වන නම කුමක්ද?

   1) Secrecy ගුප්තතාව
   2) Attenuation හායනය
   3) Modulation මූර්ජනය
   4) End To End
   5) Encryption ගුප්ත කේතනය